පාර්ලිමේන්තු ප්‍රකාශන අංක - 290

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය බදුල්ල
පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் - 290

மாவட்ட செயலகம் - பதுளை

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் நிறுவன பொறுப்பு கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No – 290

District Secretariat – Badulla
Submission of observation of Hon. Minister and steps taken with regards to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No.119 (4)

ඇමුණුම 01

<u>**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද ස්ථාවර නියෝග 119 (4) සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගනු ලබන පියවරයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.**</u>

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 290

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය බදුල්ල.

| රා.ගි.කා. සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මඟපෙන්වීම | ගණන් දීමේ නිලධාරි විසින් ගත් ක්‍රියාමාර්ග | වර්තමාන ප්‍රගතිය |
|---|---|---|
| විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි. | පිළිගනිමි. කාර්තුවකට වරක් පවත්වන සෑම විගණන කළමනාකරණ කමිටු රැස්වීමේදීම මේ සම්බන්ධයෙන් දැනුවත් කරන අතර, ප්‍රගති සමාලෝචනය සිදු කරයි. ප්‍රමාදය වලක්වා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත. විගණන විමසුම් වලට පිළිතුරු නියමිත දිනට නිවැරදිව ලබාදෙන ලෙස සියළුම ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කර ඇත. | විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීමට ප්‍රමාදවීම අවමකර ගැනීමට කටයුතු සිදුකර ඇත. |
| අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය. | පිළිගනිමි. කාර්තුවකට වරක් පවත්වන සෑම විගණන කළමනාකරණ කමිටු රැස්වීමේදීම මේ සම්බන්ධයෙන් දැනුවත් කරන අතර, ප්‍රගති සමාලෝචනය සිදු කරයි. ප්‍රමාදය වලක්වා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත. විගණන විමසුම් වලට පිළිතුරු නියමිත දිනට නිවැරදිව ලබාදෙන ලෙස සියළුම ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කර ඇත. | විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීමට ප්‍රමාදවීම අවමකර ගැනීමට කටයුතු සිදුකර ඇත. |
| මු.රෙ. 134 (2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩ සටහන වර්ෂය ආරම්භයේ දී පිළියෙල කර නොතිබුණි. | මු.රෙ. 134 (2) ප්‍රකාරව මෙම වැඩ සටහන සම්පාදනය කිරීමේ දී විගණකාධිපති විමසා උපදෙස් ලබා ගැනීම ප්‍රඥාගෝචර වේ යන්න සඳහන් වන අතර, සෑම වර්ෂයකම මෙම වැඩ සටහන සම්පාදනය කර විගණකාධිපති වෙත පිටපතක් ඉදිරිපත් කර ඇත. එසේම විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ද ලබාගෙන ඇත. | නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. |

| | | |
|---|---|---|
| විගණන කමිටුව අවම ප්‍රමාණයෙන් හෝ රැස්ව නැත. | විගණන කමිටුව අවම ප්‍රමාණයෙන් හෝ රැස් කිරීම සඳහා උපදෙස් ලබා දී ඇත. | මේ වන විට නිසියාකාරව වර්ෂයට අදාළ විගණන කමිටු රැස්වීම් පවත්වා ගෙන යනු ලැබේ. |
| ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 ඡේදය ප්‍රකාරව චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියෙකු පත්කර , ඒ බව කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට දන්වා යවා නොතිබුණි. | මේ අනුව, කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත සම්බන්ධීකරණ නිලධාරියෙකු පත්කර යැවීමට උපදෙස් ලබාදෙන ලදී. | මේ වන විට කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත සම්බන්ධීකරණ නිලධාරියෙකු පත්කර යවා ඇත. |
| 2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ කාලරාමුව ඇතුළත මු.රෙ. 756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2016.03.31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව නියමිත දිනට වාර්තා ඉදිරිපත් කළ යුතු බවට අදාල නිලධාරීන් දැනුවත් කරන ලදී. | 2023 වර්ෂයේ සිට භාණ්ඩ සමීක්ෂණ කටයුතු නියමිත කාලයට සිදු කර ඇත. |
| වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. | මේ සඳහා අවශ්‍ය අභ්‍යන්තර පාලන පද්ධතිය විධිමත් කර ඇත. ව්‍යාකූලව තිබූ බඩු වට්ටෝරු පොත් නිවැරදිව පවත්වාගෙන යාමට අවශ්‍ය වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර ඇත. අතිරික්ත ඌනතා හඳුනාගැනීමේ ගැටළුවක් පවතින බැවින්, නිවැරදි කර ගැනීමට හැකි වන පරිදි භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කිරීමට උපදෙස් ලබා දෙන ලදි. | 2023 වර්ෂයේ එම අතිරික්ත ඌනතා නිවැරදිව හඳුනාගෙන නිර්දේශ හඳුනාගෙන නිර්දේශ නියමිත කාල වකවානුව තුළ සිදු කිරීමට අවශ්‍ය විධි විධාන යොදා ඇත. |

| | | |
|---|---|---|
| වාහනයක් ගර්භිත වී මාස 8 වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබුණි. | 250-2075, 143-5118, 152-3315 ,UPGI-7454 යන වාහනයන්හි අපහරණ කටයුතු 2023 වර්ෂයේ අවසන් කර ඇත. 250-2072, 150-6312 යන වාහනයන්හි ඉදිරි කටයුතු සිදු කරමින් පවතියි. | 250-2075, 143-5118, 152-3315, UPGI-7454 යන වාහනයන්හි අපහරණ කටයුතු 2023 වර්ෂයේ අවසන් කර ඇත.<br>250-2072, 150-6312 යන වාහනයන්හි ඉදිරි කටයුතු සිදු කරමින් පවතියි. |
| රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි. | මේ වන විට UPPC-3214, UPNA-9620, UPPC-4311 දරන වාහන ගොනුවල කටයුතු අවසන් කර ඇත.<br>250-2069 , 250-2073 , UPPD 7129 දරන වාහන සම්බන්ධ ගොනුවල කටයුතු සිදු කරමින් පවතී. | වාහන 03 ක කටයුතු අවසන් කර ඇති අතර අනෙකුත් වාහන තුනෙහි කටයුතු සිදු වෙමින් පවතී. |
| 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳව පරීක්ෂා කර නොතිබුණි. | 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාල චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. | 2024 වර්ෂයේ වාහන 13 න් 06 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර අවසන් කර ඇත. අනෙකුත් වාහනවල ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමට කටයුතු කරමින් පවතී. |
| සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබිණි. | සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමට උපදෙස් ලබාදෙන ලදී. | සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය මේ වන විට පින්තාරු කර ඇත. |
| බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනයට පිළියෙළ කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනයට විගණනය වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී. | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ යැවීමට කටයුතු කර ඇත. |

| | | |
|---|---|---|
| බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළයුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි. | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළයුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී. | ගැලපුම් කළයුතු ශේෂ සියල්ල නිරවුල් කර ඇත. |
| වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | මෙම හිඟ ණය ශේෂ වලින් පළාත් සභා නිලධාරීන්ට අදාල ණය ශේෂ නිරවුල් කිරීම සම්බන්ධයෙන් පළාත් සභාව දැනුවත් කර ඇත. අනෙකුත් ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු සිදු කිරීමට අදාළ නිලධාරින්ට උපදෙස් ලබාදෙන ලදී. | මේ වන විට 2021 වර්ෂයේ තිබුණු හිඟ ණය ශේෂයෙන් රු. 3,640,014.24 ක මුදලක් නිරවුල් වී ඇත. ඉතිරිය නිරවුල් කිරීම සඳහා කටයුතු සිදු කර ඇත. |
| පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කරන ලෙස උපදෙස් ලබාදෙන ලදී. | මේ වන විට 2021 වර්ෂයේ පොදු තැන්පත් ගිණුමේ පැවති ශේෂයෙන් රු. 5,406,684.92 ක මුදලක් නිරවුල් වී ඇත. ඉතිරිය නිරවුල් කිරීම සඳහා කටයුතු කරමින් පවතී. |
| මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්යය අතුරු අග්‍රිම කාර්යය නිමවී දින 10 ක් ඇතුළත නිරවුල් කර නොතිබුණි. | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්යය අතුරු අග්‍රිම කාර්යය නිමවී දින 10 ක් ඇතුළත නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී. | නිසි පරිදි අත්තිකාරම් පියවීමට කටයුතු කර ඇත. |
| ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි. | පිළිගනිමි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල මෙය ක්‍රියාත්මක කරන ලෙස දැනුම් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙබ් අඩවිය තුළ 2022.05.13 දින සිට මේ සඳහා පහසුකම් සපයා ඇත. |

| | | |
|---|---|---|
| සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. | මේ සම්බන්ධයෙන් පුහුණු වැඩසටහනක් ඉල්ලා ඇත. | මේ වන විට මාණ්ඩලික නිලධාරීන් සියලුම දෙනා කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව ඇත. |
| ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය. | මූල්‍ය ප්‍රකාශ වලින් සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන විගණන මතයක් ලබා ගැනීම සඳහා අදාළ නිලධාරීන් දැනුවත් කරන ලදි. | 2021 සිට 2022 වර්ෂ වල මූල්‍ය ප්‍රකාශන සඳහා තත්ත්වාගණනය කළ විගණන මතයක් ලබා දී ඇත. |
| සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි. | සැලසුම්ගත පුහුණු අවස්ථා ප්‍රමාණය කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් අඩු ප්‍රමාණයක් සිදුකළ අතර, ඉදිරියේ දී මානව සම්පත් සැලැස්මට අනුව සිදු කිරීමට අදාළ උපදෙස් ලබා දෙන ලදී. | 2022 වර්ෂයේ සිට සැලසුම්ගත පුහුණු පාඨමාලා අදාළ කාලය තුළ සිදුකර ඇත. |

පණ්ඩුක ශ්‍රී ප්‍රභාත් අබේවර්ධන,
දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
බදුල්ල.

පණ්ඩුක ශ්‍රී ප්‍රභාත් අබේවර්ධන
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
බදුල්ල.

ජේ.එම්.පී. සිරිවර්ධන,
ප්‍රධාන ගණකාධිකාරී (වැ.බ.),
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
බදුල්ල.

ජේ.එම්.පි. සිරිවර්ධන
ප්‍රධාන ගණකාධිකාරී(වැ.බ)
බදුල්ල දිස්ත්‍රික් ලේකම් වෙනුවට

## ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

ප්‍රදීප් යසරත්න

ලේකම්,

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා
හා පළාත් පාලන අමාත්‍යාංශය
(ස්වදේශ කටයුතු අංශය)
"නිල මැදුර" ඇල්විටිගල මාවත, කොළඹ 05.

## ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2024 වර්ෂය තුළ දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළඟා කර ගැනීමට අපේක්ෂා කරමි.

දිනේෂ් ගුණවර්ධන (පා.ම.)

අග්‍රාමාත්‍ය සහ

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය.